www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජෝති බාසු: ඉන්දියානු ස්ටැලින්වාදයේ වැඩිමහලු රාජ්‍යතාන්ත්‍රිකයා 95 වන වියෙහි දී මිය යයි

## Jyoti Basu: elder statesman of Indian Stalinism dies at 95

ක්‍රාන්ති කුමාර සහ කීත් ජෝන්ස් විසිනි

2010 ජනවාරි 19

ඉන්දියාවේ ප්‍රධාන ස්ටැලින්වාදී පාර්ලිමේන්තු පක්ෂය වන ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ පිලිගත් වැඩිමහලු රාජ්‍යතාන්ත්‍රිකයා වූ ද නැගෙනහිර ඉන්දියාවේ බටහිර බෙංගාල ප්‍රාන්තයේ වසර 23ක් තිස්සේ මහ ඇමති වූ ද ජෝති බාසු ඉරිදා මිය ගියේය. එවිට ඔහු 95 වන වියෙහි පසුවිය.

බාසු 2000 දී බටහිර බෙංගාලයේ මහ ඇමති තනතුරෙන් විශ්‍රාම ගිය නමුදු, සිය ජීවිතයේ අවසන් මාස ගනනාව වන තෙක්ම ඔහු ඉන්දියානු දේශපාලනයේ ප්‍රධාන චරිතයක්ව සිටියේය.

ඉන්දියාවේ පශ්චාත් -1991 නව-ලිබරල්වාදී ආර්ථික "ප්‍රතිසංස්කරන" වැඩපිලිවෙල් ද එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග ඇති කර ගැනෙන මූලෝපායික හවුල්කාරිත්වයේ ද නිර්මාතෘ ලෙස මහ ව්‍යාපාරිකයනගේ ගෞරවයට පාත්‍ර වී සිටින ඉන්දියානු අගමැති මන්මෝහන් සිං, බාසුට ප්‍රශංසා කිරීමෙහි ලා සමස්ත ඉන්දියානු දේශපාලන ප්‍රභූව වෙනුවෙන් මූලිකත්වය ගත්තේය.

"බාසු මැතිතුමා සමග මට පුද්ගලිකව ඉතා දිගු කාලීන සබඳතාවක් තිබේ" යයි සිං ප්‍රකාශ කලේය. "මගේ දේශපාලන දිවිය තුල බොහෝ වතාවන්හි දී, බටහිර බෙංගාලය සම්බන්ධ කරුනක් වේවා නැතහොත් ජාතික වැදගත්කමක් දරන කාරනාවක් වේවා, සෑම අවස්ථාවක දී ම ඔහුගේ ඥානාන්විත උපදෙස් පතා මම ඔහු වෙත හැරී ඇත."

කොංග්‍රස් පක්ෂයේ සභාපතිනි සෝනියා ගාන්ධි බාසුට ප්‍රශංසා කලේ, "සමාජ යුක්තියේ හා සමානත්වයේ සටන්කරුවකු . . . අන් සියල්ලටම ඉහලින් සෑම අවස්ථාවක දී ම ජාතික අවශ්‍යතාව තබන සැබෑ දේශප්‍රේමියකු" ලෙස ය. ඔහුගේ "අගනා විනිශ්චය හා ගැඹුරු අත්දැකීම් ඉහලින් ම අගය කෙරුනි."

සිය ජීවිතය මත බාසු ඇති කල බලපෑම, සිය නැන්දනිය වූ හිටපු අගමැතිනි ඉන්දිරා ගාන්ධි සහ ඝාතනයට ලක් තවත් අගමැතිවරයකු වන සිය සැමියා වූ රජීව් ගාන්ධි ඇති කල බලපෑමට පවා ගාන්ධි සම කලාය. "ඉන්දිරාජී සහ රජීව්ජී සමග එකට ඉහලම ගෞරවනීය තැනක මම (බාසුව) තබමි."

සීපීඑම් දැවැන්තයා වෙත ප්‍රශංසා වැසිවැස්සවීමට කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රධානියෝ ද හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) ඇතුලු ඉන්දියාවේ ප්‍රධාන සංස්ථාපිත පක්ෂවල නායකයෝ ද එක්වූහ.

ඉන්දියාවේ ප්‍රමුඛතම බහුජාතික සමාගම වන ටාටා කර්මාන්ත සමූහයේ සභාපති රටන් ටාටා, ප්‍රකාශ කලේ, බාසු "ජාතියේ හා බටහිර බෙංගාලයේ ශ්‍රේෂ්ට නායකයකු " බවයි.

දැවැන්ත ආර්පීජී ව්‍යාපාර සමූහයේ විශ්‍රාමලත් සභාපති ආර්.පී. ගොඑන්කා මෙසේ පැවසීය: "ජෝති බාසුගේ අභාවයෙන් ඉන්දියාව තවත් අසරන වී තිබේ."

ඉන්දියානු කර්මාන්ත සම්මේලයේ සභාපති වේනු සිරිනිවාසන්, ඉන්දියාවේ "දැවැන්තව නායකයන්ගෙන්" කෙනෙකු ලෙස බාසු විස්තර කලේය.

කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුවක් බලයට ගෙන එනු පිනිස සීපීඑම් නායකත්වයෙන් යුක්ත වාම පෙරමුන සමග එක්වනු වස් විවිධ ප්‍රාදේශීය හා කුල-පාදක පක්ෂ ගොනු කිරීමට උදව් කරමින්, 2004 දී කොංග්‍රස් පක්ෂයේ නායක්තවයෙන් යුක්ත එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුව තැනීමෙහි ලා බාසු තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කල බව යූපීඒ මුදල් ඇමති ප්‍රනාබ් මුඛර්ජී මතක් කලේය. බාසුගේ බලවත් ඉල්ලීම මත, සීපීඑම් වසර හතරක් තිස්සේ යූපීඒ ආන්ඩුවට මුක්කුව දුන්නේ, එය දක්ෂිනාංශික සමාජ-ආර්ථික හා විදේශ පිලිවෙත් අනුගමනය කිරීම ද නොතකා ය. එම පිලිවෙත් ඊට පෙර බලයේ සිටි බීජේපී ආධිපත්‍යය දැරූ ආන්ඩුව අනුගමනය කල

පිලිවෙත්වලින් එතරම් වෙනස් නොවන බව ස්ටැලින්වාදීන් පවා පිලිගත්තේය.

සත්‍යය පැවසුව හොත්, පසුගිය දශක දෙකේ දී සිවු වතාවක්, එනම්, 1989, 1991, 1996 හා 2004 දී, බාසු සහ සීපීඑම් දේශපාලන මන්ඩලය, ඉන්දියාවේ ජාතික ආන්ඩු තැනීමෙහිලා, තීරනාත්මක නොවේ නම් වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කලේය.

1996 දී බාසු ඊනියා එක්සත් පෙරමුනු ආන්ඩුවක අගමැති බවට පත්වීමට ඉතා ආසන්න විය. සීපීඑම් දේශපාලන මන්ඩලයේ බහුතරයක් ආන්ඩුවට එක්වීමට එරෙහිව ඡන්දය දුන් නිසා ඔහුගේ නාමයෝජනාව වැලකුනි. ඒ වෙනුවට සීපීඑම් එක්සත් පෙරමුනු ආන්ඩුවට "පිටත" සිට සහයෝගය දුනි. ඒ සමගම ආන්ඩුවේ පිලිවෙත් සූත්‍රගත කිරීමට සහයෝගය දෙමින් යන්තම් අටවා ගැනුනු එක්සත් පෙරමුනු සභාගය නොකැඩී එකට තබා ගැනීමට කටයුතු කලේය.

වසර ගනනාවකට පසුව, බාසු 1996 දේශපාලන මන්ඩලයේ ඡන්දය "ඓතිහාසික මොට්ටකමක්" ලෙස නම් කලේය.

1964 දී සීපීඅයි වෙතින් බිඳීමේ පටන් වසර 45ක් තිස්සේ එක දිගට සීපීඅයි ඉහල නායක මන්ඩලයේ සේවය කර ඇති බාසු දේශපාලන මන්ඩලයේ නිත්‍ය සාමාජිකත්වයෙන් විශ්‍රාම ගැනීමට ඉඩ දෙන ලෙස කල ඉල්ලීම්වලට සීපීඑම් ඉහල නායකත්වය නැමුනේ පසුගිය වසන්තයේ දී පැවති මෑත ම ත්‍රෛවාර්ෂික පක්ෂ සම්මේලනයේ දී ය. කෙසේවෙතත්, " දේශපාලන මන්ඩලයේ විශේෂ ආරාධිතයා " යන තනතුර පිලිගැනිමට ඔහුට සිදු විය.

ජෝති කිරාන් බාසු, 1914 ජුලි 8 දා, එනම්, පලමු වන ලෝක යුද්ධය පිපිරීමට යන්තම් සති කිහිපයකට පෙර, කල්කටාවේ ධනවත් මධ්‍යම පන්තික පවුලක, උපත ලැබීය. ඔහුගේ පියා වෛද්‍යවරයකු වූ අතර නැගෙනහිර බෙංගාල ඉඩම් හිමියකුගේ දියනියක වූ ඔහුගේ මව, එකල පැවති සම්ප්‍රදායට අනුව, ගෘහනියක් වූවාය. ඉහල පෙලේ පුද්ගලික ඉංග්‍රීසි මාධ්‍ය පාසල්වල ඉගෙනුම ලැබූ බාසු අවසානයේ කල්කටා විශ්වවිද්‍යාලයේ ජනාධිපති විද්‍යාලයයෙන් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය ලැබීය.

බාසු 1935 දී, නීතිය හදාරා නීතිඥයකු වීම පිනිස එංගලන්තය බලා ගියේය. එහි ලගා වී මඳ කලකින් ඔහු ඉන්දියානු සිසුන් අතර පැවති බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය සමග සම්බන්ධ වී එමගින් මහා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට් පක්ෂයේ (සීපීජීබී) කක්ෂය තුලට පැමිනියේය.

සිය මතක සටහන්වල දී, ඉන්දියානු ජාතිකවාදයේ සිට මාක්ස්වාදය දක්වා සිදු වූ යයි කියන ඔහුගේ පරිවර්තනය ගැන බාසු කතා කරන්නේ ඉතා මද වසයෙනි. එහෙත් ස්ටැලින්වාදී සීපීජීබී පාසල තුල සිය පුහුනුව ඇරඹීමෙන් පසුව, කොංග්‍රස් පක්ෂයේ නායක හා ස්වාධීන ඉන්දියාවේ අනාගත අගමැති ජවහර්ලාල් නේරු බ්‍රිතාන්‍යයට පැමිනි අවස්ථාවක ඔහු හා තමා අතර පැවති සාකච්ඡාවක් ගැන බාසු වාර්තා කරයි.

"මම සමාජවාදය ගැන විශ්වාස කරනවා යයි මා නේරුට පැවසූ බව මට මතකය" යයි බාසු ලියයි. "නේරු මෙසේ පිලිතුරු දුනි, අපගේ ප්‍රථම කර්තව්‍යය වන්නේ ඉන්දියාවට නිදහස දිනාගැනීමයි. ඔබලා ඒකට එකග ද?, මම එයට ඔව් යයි පිලිතුරු දුන්නෙමි. එමෙන් ම (ඉන්දියානු ශිෂ්‍යයන් විසින් සංවිධානය කරනු ලබන) පිලිගැනීමේ උත්සවයකට සහභාගි වන ලෙස ඔහුට ආරාධනා කලෙමි."

බාසු සීපීජීබී වෙත ආකර්ෂනය වී ඔවුන් විසින් දේශපාලනිකව පුහුනු කරනු ලැබුවේ 1930 ගනන් මැද හා අග දී ය. එය වනාහි, මහජන පෙරමුනු දේශපාලනයේ උච්චතම සමය විය, සීපීජීබී නායකත්වයේ උද්යෝගිමත් පිලිගැනීම යටතේ, සෝවියට් ස්ටැලින්වාදී නිලධරය මොස්කව් නඩු විහාග රග දැක්වූ, ලියොන් ට්‍රොට්ස්කිගේ ඝාතන සංවිධානය කල සහ මහජන පෙරමුනේ, එනම් ප්‍රජාතන්ත්‍ර අධිරාජ්‍යවාදීන් සමග ඇති කරගැනුනු ෆැසිස්ට් විරෝධී යයි කියන ලද සන්ධානයක, නමින් යුරෝපා විප්ලවයේ, වඩාත් විචිත්‍ර හා ඛේදනීය ලෙස ස්පාඤ්ඤ විප්ලවයේ, ගෙල හිර කරමින් සිටි වකවානුවක් විය.

බාසුට අනුව, ඔහුගේ ප්‍රධාන ගුරුවරු වූයේ සීපීජීබී ප්‍රධාන ලේකම් හැරි පොලිට් සහ රජනි පාම් දත් සහ ක්ලෙමන්ස් දත් වැනි ස්ටැලින්ගේ සෙසු කුප්‍රකට එහෙයියන් ය.

ඔවුන් බාසුට දුන් දේශපාලන උපදේශවල කේන්ද්‍රීය කාරනා වූයේ "තනි රටේ සමාජවාදය" පිලිබඳ ස්ටැලින්වාදී පිලිවෙත සහ අවධි දෙකේ විප්ලවය පිලිබඳ ස්ටැලින්වාදී-මෙන්ෂෙවික් න්‍යායයි. එනම්, ඉන්දියාව වැනි කල් පසුවූ ධනවාදී වර්ධනයක් සහිත රටවල දී මාක්ස්වාදීන්ගේ කර්තව්‍යය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී නැතහොත් අධිරාජ්‍ය-විරෝධී විප්ලවය සම්පූර්න කිරීමෙහි ලා ජාතික ධනේශ්වරයට සහාය දීම යන්නයි. 1917 රුසියානු විප්ලවයේ ධනාත්මක අත්දැකීම සහ 1927 දී ධනේශ්වර කුවෝමිංටෑන් විසින් චීන විප්ලවය තලා දැමීම යන දෙකම නොතකා, ස්ටැලින්වාදීන් අවධාරනය කලේ, ධනේශ්වර-ප්‍රජාතන්ත්‍ර විප්ලවය සම්පූර්න වීම, ධනවාදය ශක්තිමත් වීම සහ අවසානයේ සමාජවාදය සඳහා කොන්දේසි "පරිනතවීම" වන තෙක් කම්කරු පන්තියට නායකත්වය සඳහා අභියෝග කල නොහැකි බව සහ එසේ නොකල යුතු බවයි.

බාසු 1941 දී ඉන්දියාවට පෙරලා පැමිනි අතර ඉන් අනතුරුව ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයට එනම් සීපීඅයි සංවිධානයට බැඳුනි. ඔහුගේ පැමිනීමෙන් මද කලක් යාමට පෙරාතුව, නාසිවරු සෝවියට් සංගමය ආක්‍රමනය කල අතර, සීපීඅයි, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය සමග චර්චිල්ගේ හා රූස්වෙල්ට්ගේ මිලිටරි සන්ධානය අවුල් නොකරනු පිනිස ඉන්දියාව තුල බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි අරගලය කල් දැමිය යුතු යයි අවධාරනය කරමින්, බ්‍රිතාන්‍ය යුද ව්‍යායාමයේ භක්තිමත් ආධාරකරුවකු ලෙස ඉස්මතු විය. එහි යුද-ගැති හා බ්‍රිතාන්‍ය-ගැති ආස්ථානය හේතු කොටගෙන, සීපීඅයි සංවිධානයට, සිය ඉතිහාසයේ ප්‍රථම වතාවට, තමන්ගේම නමින් දේශපාලන වැඩකටයුතු කරගෙන යාමට ඉඩ ලැබුනි. ඔවුන්ගේ ප්‍රථම කර්තව්‍යයක් වූයේ, කොංග්‍රස් පක්ෂය ආරම්භ කල සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරයක් වූ ද ඉක්මනින්ම කොංග්‍රස් නායකත්වයේ ග්‍රහනයෙන් මිදී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි සන්නද්ධ නැගිටීමකට ඉතා ආසන්න වූ, 1942 ක්විට් ඉන්දියා (ඉන්දියාවෙන් පිටවනු) ව්‍යාපාරයට විරුද්ධ වීමයි. එය මඩිනු පිනිස දස දහස් ගනනක බ්‍රිතාන්‍ය හමුදා භටයන් බලමුලුගැන්වීමට සිදු විය.

යුද්ධයේ අවසානයත් සමග, කලල ස්වරූප විප්ලවීය ස්වභාවයක් දැරූ කම්කරු හා ගොවි අරගලවලින් ඉන්දියාව සොලවාලනු ලැබීය. සීපීඅයි විවිධ කම්කරු හා ගොවි අරගලවල නායකත්වයට පැමිනි අතර, එය සිය ආනුභාවය යටතේ සිටි එම කම්කරු හා ගොවි ජන කොටස් මෙහෙයවූයේ ජාතික-ප්‍රජාතන්ත්‍ර විප්ලවයට නායකත්වය දෙන ලෙස කොංග්‍රස් පක්ෂයට හා මුස්ලිම් ලීගයට බලපෑම් දැමීම පිනිසය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ධනේශ්වරයට මහජන නැගිටීම පාලනය කොට අවසානයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග සම්මුතියකට පැමිනීමට හැකි විය. එම සම්මුතිය යටතේ සිය දේපොලවල හා ධනයේ ආරක්ෂාව සහතික කරගනු පිනිස විජිත රාජ්‍ය යන්ත්‍රයේ උරුමය ලබා ගැනීමට එයට හැකි වූ අතර ඉන්දියාවේ වැඩ කරන ජනතාව පෙලීමට ලක් කල ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ මූලික ගැටලු, අධිරාජ්‍යවාදී පීඩනයෙන් නිදහස් වීම, ඉඩම්හිමි ග්‍රහනය හා කුල පීඩනය අහෝසි කිරීම සහ දකුනු ආසියාවේ ස්වේච්ඡා ඒකාබද්ධතාව, තවත් ඔද්දල් වීමට අතහැර දැමුනි.

දෙවන ලෝක යුද්ධට අවසානයට ලගා වන විට, බාසු දුම්රිය වෘත්තීය සමිති නිලධාරියකු බවට පත් වූ අතර 1946 දී ඔහු බෙංගාල ව්‍යවස්ථාදායක මන්ඩලයේ (පිරිමි ජනගහනයෙන් සියයට 10ක පමන කොටසකට පමනක් ඡන්දය දීමේ අයිතිය ලැබුනු විජිතවාදී ප්‍රයෝගයක්) වෙන් කෙරුනු "කම්කරු" ආසනවලින් එකකට තෝරා පත් කෙරුනි. පකිස්ථානය සඳහා වූ ඉල්ලීම, එනම්, උප-මහාද්වීපය වාර්ගිකව බෙදා වෙන් කිරීම සඳහා වූ ඉල්ලීම, ප්‍රගතිශීලී හා එය මුස්ලිම් ජනතාවගේ "ස්වයං-නිර්නය" පිලිබඳ ව්‍යායාමය නියෝජනය කරන්නේ ය යන සීපීඅයි ප්‍රතිගාමී කියාපෑම අනුව යමින්, බෙංගාලයේ බ්‍රිතාන්‍ය පලාතෙන් අඩක් ඉන්දියාවට ද ඉතිරි අඩ පකිස්ථානයට ද යමින් එම පලාත බෙදීම පිලිබඳ කාරනාව 1947 දී ව්‍යවස්ථාදායක මන්ඩලය ඉදිරියට පැමින කල, බාසු එයට පක්ෂව ඡන්දය දුනි.

නිදහසෙන් පසුව 1951-52 දී පැවති ප්‍රථම ඉන්දියානු මැතිවරනයේ දී බාසු බටහිර බෙංගාල ප්‍රාන්ත සභාවට තේරී පත් විය. ඔහු ප්‍රාන්ත සභාවේ සීපීඅයි මන්ත්‍රී කන්ඩායමේ නායකයා ලෙස නම් කෙරුනු අතර 2000 දී ඔහු විශ්‍රාම යන තෙක් ම බටහිර බෙංගාල ප්‍රාන්ත සභාවේ සීපීඅයි කන්ඩායමේ සහ පසුව සීපීඑම් කන්ඩායමේ නායකයා හෝ තථ්‍ය නායකයා ලෙස සිටියේය.

1960 ගනන් මුල වන විට, සීපීඅයි වැඩෙන අර්බුදයකට මුහුන දුනි. සැලකිය යුතු මට්ටමකට අර්බුදය, කොංග්‍රස් මධ්‍යම ආන්ඩුව කේරලයේ සීපීඅයි නායකත්වයෙන් යුක්ත ආන්ඩුව බලයෙන් පහ කිරීමෙන් පසුව පවා, පක්ෂ නායක්තවය කොංග්‍රස් පක්ෂය සමග පැවති සමීප සබඳතා ගැන ඇති වූ නොඑකගතා තුල මුල්බැසගත් අතර ම, 1962 චීන-ඉන්දියානු දේශසීමා යුද්ධය හා චීන-සෝවියට් භේදය මගින් එය වඩාත් තීව්‍ර කෙරුනි.

බාසු, පෙනෙන පරිදි සැලකිය යුතු පැකිලීමකින් යුක්තව, 1964 දී විපරීමතධාරීන් සමග එක්ව පක්ෂයෙන් බිඳුනු අතර සීපීඑම් පිහිටුවීමේ දී එහි දේශපාලන මන්ඩලයට තේරී පත් වූ සාමාජිකයන් නව දෙනාගෙන් එක් අයෙක් විය. බටහිර බෙංගාලය "සංශෝධනවාදී" ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයට එරෙහි විරුද්ධත්වයේ එක් කේන්ද්‍රස්ථානයක් බව මෙහිදී සටහන් කර ගැනීම මනාය. බාසු නව පක්ෂයට එක් නොවුනා නම්, ඔහුගේ පාර්ලිමේන්තු ජීවිකාවට බරපතල ලෙස හානි වීමට ඉඩ තිබුනි.

සීපීඑම් ආරම්භක ලියවිල්ල මෙන්ෂෙවික්-ස්ටැලින්වාදී අවධි දෙකේ විප්ලව න්‍යායට එහි ඇති දෘඩතර කැපවීම සහතික කලේය. මහ ධනේශ්වරයේ කොටස් ඇතුලු ඉන්දියානු ධනේශ්වරයේ කොටස් අධිරාජ්‍යවාදය සමග ගැටුමකට තල්ලු වී "රාජ්‍ය බලය සමග එරෙහි වීමට බල කෙරෙනු" ඇති බවත් එබැවින් ඔවුන්ට "මහජන ප්‍රජාතන්ත්‍ර පෙරමුන තුල තැනක් සොයා ගත " හැකි වන බවත් එය ප්‍රකාශ කලේය.

ප්‍රජාතන්ත්‍ර විප්ලවය ජයග්‍රහනය කරා ගෙන යාමේ විධි ක්‍රමයක් ලෙස දිග්ගැසුනු ගොවිජන-පාදක ගරිල්ලා යුද්ධය පිලිබඳ මාඕවාදී න්‍යායන්ගේ ආනුභාවය ලද සීපීඅයි කේඩර සීපීඑම් පිහිටුවීමට එක්වූහ. එහෙත්

නව පක්ෂය මාඕවාදය වැළඳගැනීම තබා, චීනය සමග පෙලගැසීම ද ප්‍රතික්ෂේප කලේය.

ඒ වෙනුවට සීපීඑම්, තමන් මොස්කව් හෝ බෙයිජිං යන එකඳු පාර්ශ්වයකට හෝ සහයෝගය නොදෙන බව ප්‍රකාශ කරමින්, ස්වාධීන, ඉන්දියානු ජාතිකවාදී යොමුවක් ගත්තේය. භේදයට පෙර සීපීඅයි මෙන් ම, එය සිය වැඩකටයුතු දිගටම යොමු කලේ, පාර්ලිමේන්තු දේශපාලනය ද සාමූහික කේවලයේ සීමා පිලිගැනීමක් මත පාදක වූ වෘත්තීය සමිති අරගල ද වෙතය.

1960 ගනන් අග වන විට බටහිර බෙංගාලය ද සමස්තයක් ලෙස වඩවඩා ඉන්දියාව ද යලිත් වරක් දැවැන්ත සමාජ අරගල මගින් සොලවාලනු ලැබීය.

මාඕවාදියෝ, උත්තර බටහිර බෙංගාලයේ හුදකලා ගමක් වූ නක්සල්බාරිහි දී "මහජන යුද්ධයක්" ආරම්භ කිරීමට උත්සාහ කිරීමෙන් මද කලකට පසුව, සීපීඑම් වෙතින් බිඳී සීපීඅයි (මාක්ස්වාදී-ලෙනින්වාදී) තැනූහ.

කම්කරු පන්තිය දේශපාලනිකව උගන්වාගැනීමේ සහ සියලු වැඩ කරන ජනතාවගේ දේශපාලන නායකත්වය බවට එය පත් කිරීමේ අරගලයට පිටුපස හැරවූ මාඕවාදියෝ ඉඩම්හිමියන්ට හා සෙසු සුලු පීඩකයන්ට එරෙහිව පලිගැනීමේ ප්‍රහාර අවුලුවාලීමට ප්‍රයත්න දැරූහ. වඩාත් දේශපාලනිකව ව්‍යසනකාරි ලෙස, ඔවුහු සිය සීපීඅයි හා සීපීඑම් විරුද්ධවාදීන්ට එරෙහිව ප්‍රචන්ඩ ප්‍රහාර එල්ල කලහ. මෙම උපායන් මගින් සිදු වූයේ දේශපාලන ව්‍යාකූලත්වය පැතිරවීම සහ මහා පරිමාන මර්දනයක් සඳහා රාජ්‍යයට කඩතුරාවක් සම්පාදනය කිරීම පමනය.

සීපීඅයි හා සීපීඑම්, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, ප්‍රතිචාර දැක්වූයේ නක්සල්වාදය තුරන් කර දැමීමට ඉන්දියානු ධනේශ්වර රාජ්‍යය ගෙන ගිය මර්දන ව්‍යාපාරයේ දී එය සමග පෙලගැසීම මගිනි. 1967-68 දී හා යලිත් 1969-70 දී සීපීඑම් හා සීපීඅයි මන්දායුෂ බටහිර බෙංගාල එක්සත් පෙරමුනු ආන්ඩු දෙකකට සහභාගි වූහ. විවිධාකාර ස්වයං-ප්‍රකාශිත සමාජවාදී පක්ෂ සහ කොංග්‍රස් පක්ෂයෙන් බිඳිනු කන්ඩායමක් වූ බෙංගාල කොංග්‍රසය මෙම ආන්ඩුවලට සම්බන්ධව සිටියහ. මෙම ආන්ඩු දෙකේ දී ම, බාසු බෙංගාල කොංග්‍රසයේ මහ ඇමතිවරයකු යටතේ නියෝජ්‍ය මහ ඇමති තනතුර දැරීය.

අවසානයේ සීපීඅයි හා බෙංගාල කොංග්‍රසය යන දෙකම ඉන්දිරා ගාන්ධි සහ කොංග්‍රස් පක්ෂ නායකත්වය සමග සිය සාමය ඇති කර ගත්හ. එවිට සීපීඑම් සිය පක්ෂයේ නායකත්වයෙන් යුක්ත බටහිර බෙංගාල ආන්ඩුවක් සඳහා ප්‍රාන්ත සභාව තුල අවශ්‍ය සහයෝගය ගොනු කරගැනීමට අපොහොසත් විය.

ඔහුගේ ස්ටැලින්වාදී ප්‍රශස්තිකරුවන්ට අනුව, බාසුගේ දැවැන්තම ජයග්‍රහනය වූයේ, 1977 ප්‍රාන්ත මැතිවරනයෙන් පලමුව බලයට පැමින මේ දක්වා බාධාවකින් තොරව දිගටම එම ප්‍රාන්තය පාලනය කර ඇති බටහිර බෙංගාල වාම පෙරමුනු ආන්ඩුවේ නිර්මාතෘ වීම ය.

එහෙත් වාම පෙරමුනේ ජයග්‍රහනය පැමිනියේ බාසු හා සීපීඑම් නායකත්වය මවිතයට පත් කරමිනි. ඔවුහු 1977 ජූනි බටහිර බෙංගාල මැතිවරනය සඳහා, ජනතා පක්ෂය සමග මැතිවරන පෙරමුනක් තැනීමට සූදානමින් සිටියහ. ජනතා පක්ෂය යනු, ඉන්දිරා ගාන්ධි සිය වසර දෙකක හදිසි නීති පාලනය අවසන් කිරීමෙන් පසුව 1977 දී තනන ලද හින්දු ජාතිකවාදීන් ද ඇතුලු ඇයගේ ධනේශ්වර විරුද්ධවාදීන්ගේ තාවකාලික සන්ධානයකි. ජනතා පක්ෂයේ නාමයෝජනාකරුවන්ට බහුතර ආසන සංඛ්‍යාවක් තරග කිරීමට ඉඩ දීමට පවා ඔවුහු සූදානම්ව සිටියහ. එහෙත් ජනතා පක්ෂ නායකත්වය දැඩි කේවලක් සඳහා උත්සාහ කල තතු යටතේ සාකච්ඡා බිඳවැටුනි.

වඩාත් අතිමූලිකව ගත් කල, ඊට පෙර පැවති කාල පරිච්ඡේදය පුරාම, සීපීඑම් ක්‍රියා කර තිබුනේ, හදිසි නීතියට හා කොංග්‍රස් ආන්ඩුවට එරෙහි කම්කරු පන්තියේ විරුද්ධත්වය විවිධාකාර ධනේශ්වර විරුද්ධ පක්ෂ සමග පැවති සිය උපාමාරුවලට යටත් කොට, 1977 මැතිවරනයේ දී ජනතා පක්ෂයට ජයගැනීම සඳහා මාවත සැකසීමට ද පෙර දශකයේ බොහෝ කාලයක් පුරා ඉන්දියාව වෙලාගත් සමාජ අසහන රැල්ල නිවා දැමීමේ හැකියාව ධනේශ්වරයට ලැබීම ද පිනිස මාවත සැකසීමට උදව් කිරීම පිනිසය. බටහිර බෙංගාල වාම පෙරමුනේ සීපීඑම්හි හවුල්කරුවන් වූ, ස්ටැලින්වාදී සීපීඅයි සම්බන්ධයෙන් ගත් කල, එය කොංග්‍රස් ආන්ඩුව 1974-75 දුම්රිය වර්ජනය බිඳ දමා හදිසි නීතිය පැනවූ තතු යටතේ පවා ඉන්දිරා ගාන්ධිට හා කොංග්‍රස් ආන්ඩුවට සහයෝගය දී තිබුනි.

තවත් කාරනාවක් මෙහි දී මතු කල යුතුය: ඉන්දියානු ධනේශ්වරය සීපීඑම් නායකත්වයෙන් යුක්ත වාම පෙරමුනු ආන්ඩුවක් ඉවසා සිටීමට කැමති වූයේ නම්, ඒ 1960 ගනන් අග හා 1970 ගනන් මුල දී නක්සල්වාදීන්ට එරෙහි රාජ්‍ය මර්දනයට දුන් සිය සහයෝගය හා සහභාගිත්වය මගින් ස්ටැලින්වාදීන් "ජාතික අවශ්‍යතා" ක්ෂමාවිරහිත ලෙස ආරක්ෂා කිරීමට ඇති සිය කැපවීම පෙන්නුම් කර තිබූ බැවිනි.

ජෝති බාසුගේ මහ ඇමති පාලනය යටතේ, බටහිර බෙංගාල වාම පෙරමුනු ආන්ඩුව, එය බලයේ සිටි මුල් වසර ගනනාව තුල දී, සමහර ප්‍රතිසංස්කරන,

වඩාත් අර්ථභාරී ලෙස, ගොවි ජනතාවගේ සැලකිය යුතු කොටසකට වාසි ගෙන දුන් ඉඩම් ප්‍රතිසංස්කරන, ක්‍රියාවට දැමීය.

එහෙත් අපනයන මගින් මෙහෙයවෙන ආර්ථික වර්ධන පිලිවෙත් වැලඳගනු පිනිස ඉන්දියානු ධනේශ්වරය රාජ්‍ය මගින් දිවෙන ජාතික ආර්ථික සංවර්ධනය පිලිබඳ සිය ඓතිහාසික මූලෝපාය අතහැර දැමූ කල, බටහිර බෙංගාල ආන්ඩුව, වහාම එම මාවතට අවතීර්න වූයේ, පුද්ගලීකරනය හා විශේෂ ආර්ථික කලාප වැලඳගනිමින්, තොරතුරු තාක්ෂන හා තොරතුරු තාක්ෂනය යොදාගන්නා කර්මාන්ත ක්ෂේත්‍රවල වර්ජන නීතියෙන් තහනම් කරමින් සහ නැතිනම් මහ ව්‍යාපාරිකයන්ට හිතැති පිලිවෙත් අනුගමනය කරමිනි.

සිය පසුප්‍රාප්තිකයා වන, බටහිර බෙංගාලයේ වත්මන් මහ ඇමති බුද්ධාඩෙබ් භට්ටාචාර්ජී, විශේෂ ආර්ථික කලාප වෙනුවෙන් ගොවි ජනතාව සිය ඉඩම්වලින් පලවා හැරීමට සහයෝගය පිනිස පොලිස් හා මැර ප්‍රචන්ඩත්වය යොදාගැනීම ඇතුලු, සිය ආන්ඩුවේ ආයෝජන-ගැති පිලිවෙත් ආරක්ෂා කිරීමෙන් පසුව, 2008 ජනවාරියේ දී බාසු, ධනවාදී කර්මාන්තකරනයට විකල්පයක් නැති බව අවධාරනය කරමින්, භට්ටාචාර්ජී බලගතු ලෙස ආරක්ෂා කලේය.

සිය පසුප්‍රාප්තිකයා හා දේශපාලන ගෝලයා ආරක්ෂා කරමින් බාසු මෙසේ ප්‍රකාශ කලේයඃ "සමාජවාදය මේ අවස්ථාවේ සාක්ෂාත් කරගන්න බැහැ. අප වැඩ කරමින් සිටින්නේ ධනපති ක්‍රමය තුලයි. එහි දී ප්‍රාන්ත ආන්ඩුවේ සමාජ සුභසාධන වැඩපිලිවෙලවල් දිගටම ක්‍රියාත්මක වන අතර එවන් පුද්ගලික ප්‍රාග්ධනය යොදා ගැනීමට සිදු වෙනවා."

ඔහු තව දුරටත් මෙසේ පැවසීයඃ "සමාජවාදය ඈත අනාගතයට අයිති දෙයක්. සමාජවාදය අපගේ දේශපාලන න්‍යාය පත්‍රයයි. එය අපගේ පක්ෂ ලියවිල්ලේ සඳහන් කර තිබෙනවා. නමුත් අනාගතය සඳහා අනිවාර්යය ලෙස ධනවාදය දිගටම පවතිනවා ඇති." මෙම ස්ටැලින්වාදී කෘතහස්තයාගේ දේශපාලන අන්ධභාවය වඩාත් සුපැහැදිලි වන්නේ, මෙම වචන ප්‍රකාශ කෙරුනේ 2008 සැප්තැම්බරයේ දී වෝල් වීදියේ මූල්‍ය කඩාවැටීම සමග ධනවාදයේ ඓතිහාසික බිඳවැටීමට යන්තම් මාස 8කට පෙරාතුව බව අවබෝධ කර ගත් විටය.

ඉන්දියානු සංස්ථාපිතය විසින් බාසු මත ප්‍රශංසා වැසි, ඔවුන්ගේ ඉදිරිදර්ශනය පැත්තෙන් ගත් කල, අතිශයින්ම උචිතය.

සීපීඑම්හි ප්‍රධාන නායකයා ලෙස, විශේෂයෙන්ම සිය ජීවිතයේ අවසන් සියවස් කාර්තුව තුල දී, බාසු කම්කරු පන්තිය දේශපාලනිකව මඩිමින් ද රාජ්‍ය මගින් දිවෙන ධනවාදී සංවර්ධනය බිඳවැටීමේ හා කොංග්‍රස් පක්ෂයේ දේශපාලනික කොරවීමේ පටන් නව-ලිබරල් "ප්‍රතිසංස්කරන" මගින් නිර්මිත සමාජ අර්බුදය සහ සමාජ අසහනය පාලනය කිරීමේ විධික්‍රමයක් ලෙස ධනේශ්වරය වාර්ගික හා කුලවාදී දේශපාලනයට හැරීමේ අස්ථායිකරන බලපෑම දක්වා වූ, අනේක විධ අර්බුදයන්ට මුහුන දීමේ දී ධනේශ්වරයට උදව් කරමින් ද තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලේය.

එලඹෙන සතිවල දී, *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* බාසුගේ දේශපාලන දිවිය පිලිබඳව තව බොහෝ දේ පැවසීමට තිබෙනවා ඇත. ඒ මක් නිසා ද කියතොත්, ඉන්දියාවේ ධනේශ්වර පාලනයට මුක්කු ගැසීමෙහි ලා ඉන්දියානු ස්ටැලින්වාදය ඉටු කර ඇති ක්‍රියාකලාපය එලිදරව් කිරීමක්, ඉන්දියානු කම්කරු පන්තියේ අව්‍යාජ විප්ලවවාදී සමාජවාදී පක්ෂයක් ගොඩනැගීම පිනිස තීරනාත්මක වන නිසාය.

© www.wsws.org